# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

## පරිපාලන කාර්ය මණ්ඩලය

- සහකාර ලේඛකාධිකාරී තනතුර
- සහකාර මූල්‍යාධිකාරී තනතුර
- සහකාර ලේඛකාධිකාරී තනතුර (කොන්ත්‍රාත් පදනම) - රත්මලාන පරිශ්‍රය සහ මෙට්‍රොපොලිටන් කැම්පස්

## <u>සුදුසුකම් සහ බඳවා ගැනීමේ පරිපාටිය</u>

### සහකාර ලේඛකාධිකාරී තනතුර

<u>බාහිර අයදුම්කරුවන් සඳහා</u>

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත්, පළමු හෝ දෙවන පෙළ සාමාර්ථය සහිත උපාධියක්

හෝ

(ආ) උපාධිය සමඟ පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් පරිපාලන/කළමනාකරණය** පිළිබඳ පශ්චාත් උපාධියක්/පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබිය යුතුය.

වයසඃ අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

<u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා</u>

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් මූලික උපාධිය සහිත කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි සේවය කරනු ලබන දැනට දරන තනතුරෙහි ස්ථිර කරනු ලැබූ සේවකයෙකු විය යුතුය.

හෝ

(ආ) කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි සේවය කරනු ලබන U–MN–1(II) / U–MT–1(II) කාණ්ඩයට යටත්වන තනතුරක් දරන්නෙකු විය යුතු අතර එම තනතුරේ ස්ථිර කරනු ලැබූ සේවකයෙකු විය යුතුය.

වයසඃ අවුරුදු 53 ට නොවැඩි විය යුතුය.

**

- රාජ්‍ය/ව්‍යාපාර පරිපාලනය
- කළමනාකරණය
- රාජ්‍ය ප්‍රතිපත්ති
- මානව සම්පත් කළමනාකරණය
- ආර්ථික විද්‍යාව
- නීතිය
- මූල්‍ය කළමනාකරණය
- ව්‍යාපෘති සැලසුම් හා කළමනාකරණය
- තොරතුරු තාක්ෂණය
- කළමනාකරණ/පරිපාලන විෂයයන් සැලකිය යුතු ප්‍රමාණයක් ආවරණය වන ඕනෑම විෂය ධාරාවක්

**සහකාර මූල්‍යාධිකාරී තනතුර**

බාහිර අයදුම්කරුවන් සඳහා

1. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ ඊට සමාන ආයතනයක II වන (අවසාන) විභාගය සමත් විය යුතුය.

හෝ

2. (අ) (i) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් ගිණුම්කරණය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබිය යුතුය.

හෝ

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් උපාධියක් සමඟ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ ඊට සමාන ආයතනයක මධ්‍යම මට්ටම විභාගය සමත් විය යුතුය.

හෝ

(iii) ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයෙන් (SLIATE) හෝ එහි පුරෝගාමී ආයතනයකින් ලබාගත් ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) ලබා තිබිය යුතුය.

සහ

(ආ) රාජ්‍ය ආයතනයක/රජයේ සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගිණුම්කරණය/විගණන කාර්යය සම්බන්ධ වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබිය යුතුය.

වයසඃ අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

1. (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් ගිණුම්කරණය පිළිබඳ මූලික උපාධිය සහිත කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි සේවය කරනු ලබන දැනට දරන තනතුරෙහි ස්ථිර කරනු ලැබූ සේවකයෙකු විය යුතුය.

හෝ

(ආ) කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි සේවය කරනු ලබන U–MN–1(II) / U–MT– 1(II) කාණ්ඩයට යටත්වන තනතුරක් දරන්නෙකු විය යුතු අතර එම තනතුරේ ස්ථිර කරනු ලැබූ සේවකයෙකු විය යුතුය.

සහ

2. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි හෝ උසස් අධ්‍යාපන ආයතනයක ගිණුම් අංශයෙහි/ විගණන අංශයෙහි අවම වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබිය යුතුය.

වයස : අවුරුදු 53 ට නොවැඩි විය යුතුය.

**සුදුසුකම් සීමා කිරීම් :**

(අ) බඳවා ගැනීමේ පරිපාටියට අනුව පවත්වනු ලබන ලිඛිත විභාගයට බාහිර කාණ්ඩය යටතේ හෝ අභ්‍යන්තර කාණ්ඩය යටතේ වාර දෙකකට (02) වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයෙකුට අවසර දෙනු නොලැබේ.

(ආ) කිසියම් අභ්‍යන්තර අපේක්ෂකයෙකු අභ්‍යන්තර සහ බාහිර යන කාණ්ඩ දෙක යටතේම සුදුසුකම් ලබන්නේ නම්, ඔහු/ඇය අභ්‍යන්තර කාණ්ඩය යටතේ වාර දෙකක් (02) සහ බාහිර කාණ්ඩය යටතේ වාර දෙකක් (02) ලෙස ලිඛිත විභාගයට පෙනී සිටීමට වාර හතරක් (04) අවසර දෙනු ලැබේ.

(ඇ) කිසියම් හෝ ආගමක පැවිදිවරය/පූජාවරය ලබා සිටින අයවලුන් හට බඳවා ගැනීමේ ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

**බඳවා ගැනීමේ පරිපාටිය :**

එක් එක් කාණ්ඩය යටතේ සියලුම අයදුම්කරුවන් පහත පරිදි අදාළ කාණ්ඩයට අදාළ විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ලිඛිත විභාගයකින් සමත් විය යුතුය.

- සහකාර ලේඛකාධිකාරී තනතුර

<u>බාහිර කාණ්ඩය</u>

1) බුද්ධි පරීක්ෂණය සහ තර්කනය *
2) කළමනාකරණ නිපුණතාව *
3) ඉංග්‍රීසි භාෂාව (කාණ්ඩ දෙකටම පොදුයි)

<u>අභ්‍යන්තර කාණ්ඩය</u>

1) විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ නීති සහ රෙගුලාසි *
2) සාමාන්‍ය පරිපාලනය සහ මූල්‍ය ක්‍රියාපටිපාටි *
3) ඉංග්‍රීසි භාෂාව (කාණ්ඩ දෙකටම පොදුයි)

* ලිඛිත පරීක්ෂණය ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලැබේ.

- සහකාර මූල්‍යාධිකාරී තනතුර

<u>බාහිර කාණ්ඩය</u>

1) බුද්ධි පරීක්ෂණය සහ තර්කනය *
2) ගිණුම්කරණය සහ මූල්‍ය *
3) ඉංග්‍රීසි භාෂාව (කාණ්ඩ දෙකටම පොදුයි)

<u>අභ්‍යන්තර කාණ්ඩය</u>

1) විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ නීති සහ රෙගුලාසි *
2) ගිණුම්කරණ සහ මූල්‍ය පරිපාලන ක්‍රියා පටිපාටි *
3) ඉංග්‍රීසි භාෂාව (කාණ්ඩ දෙකටම පොදුයි)

* ලිඛිත පරීක්ෂණය ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලැබේ.

**සහකාර ලේඛකාධිකාරී තනතුර (කොන්ත්‍රාත් පදනම) - රත්මලාන පරිශ්‍රය සහ මෙට්‍රොපොලිටන් කැම්පස්**

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත්, පළමු හෝ දෙවන පෙළ සාමාර්ථය සහිත උපාධියක්

හෝ

(ආ) උපාධිය සමඟ පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් පරිපාලන/කළමනාකරණය** පිළිබඳ පශ්චාත් උපාධියක්/පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබිය යුතුය.

වයසඃ අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**

- රාජ්‍ය/ව්‍යාපාර පරිපාලනය
- කළමනාකරණය
- රාජ්‍ය ප්‍රතිපත්ති
- මානව සම්පත් කළමනාකරණය
- ආර්ථික විද්‍යාව
- නීතිය

- මූල්‍ය කළමනාකරණය
- ව්‍යාපෘති සැලසුම් හා කළමනාකරණය
- තොරතුරු තාක්ෂණය
- කළමනාකරණ/පරිපාලන විෂයයන් සැලකිය යුතු ප්‍රමාණයක් ආවරණය වන ඕනෑම විෂය ධාරාවක්

**බඳවා ගැනීමේ පරිපාටිය :**

සියලුම අයදුම්කරුවන් පහත පරිදි අදාළ විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ලිඛිත විභාගයකින් සමත් විය යුතුය.

1) බුද්ධි පරීක්ෂණය සහ තර්කනය *
2) කළමනාකරණ නිපුණතාව *
3) ඉංග්‍රීසි භාෂාව

* ලිඛිත පරීක්ෂණය ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලැබේ.

**වැටුප් පරිමාණ**

1. සහකාර ලේඛකාධිකාරී තනතුර:- U-EX I (II) Rs. 50,625 – 3x1,125 – 54,000 (EB) 55,335; 12x1,335 - 71,355 p.m. + (රු. 7,800 ජීවන වියදම් දීමනාව + රු. 5,000 මාසික දීමනාව + 45% අනධ්‍යයන දීමනාව + 20% අමතර දීමනාව)

2. සහකාර මූල්‍යාධිකාරී තනතුර:- U-EX I (II) Rs. 50,625 – 3x1,125 – 54,000 (EB) 55,335; 12x1,335 - 71,355 p.m. + (රු. 7,800 ජීවන වියදම් දීමනාව + රු. 5,000 මාසික දීමනාව + 45% අනධ්‍යයන දීමනාව + 20% අමතර දීමනාව)

3. සහකාර ලේඛකාධිකාරී තනතුර (කොන්ත්‍රාත් පදනම) රත්මලාන පරිශ්‍රය :- Rs. 50,625 p.m. + (රු. 7,800 ජීවන වියදම් දීමනාව + රු. 5,000 මාසික දීමනාව)

4. සහකාර ලේඛකාධිකාරී තනතුර (කොන්ත්‍රාත් පදනම) මෙට්‍රොපොලිටන් කැම්පස් :- Rs. 55,925 p.m. + (රු. 7,800 ජීවන වියදම් දීමනාව)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

අභියෝග්‍යතා පරීක්ෂණයක ප්‍රතිඵල මත පදනම්ව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගැනීම සිදු කෙරේ.